# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2032/5 - 2017 අගෝස්තු මස 14 වැනි සඳුදා - 2017.08.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2012 (II)

### 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත

1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 37 වන වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද අමරවීර (පා.ම.),
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2017 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

01. මෙම නියෝග 2017 අංක 01 දරන අපනයන සඳහා කෘතිම උපස්ථර මත කොරල් විශේෂ වගා කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මෙම නියෝග මගින් ශ්‍රී ලංකා ජල තීරයේ තිබෙන බවට වාර්තා නොවන කොරල් විශේෂ ආනයනය කිරීමට අවසර ලැබේ.

03. අන්තරායට ලක් වූ සත්ව හා ශාක විශේෂවල අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතියේ (CITES) ලැයිස්තු ගතකර ඇති යම් කොරල් විශේෂ ආනයනය කිරීම සඳහා වන සෑම බලපත්‍රයක්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලබාගත යුතු අතර අනෙකුත් විශේෂ වලට අදාළ බලපත්‍රය මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ධීවර සහ ජලජ සම්පත් පනතේ 39 වන වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ යුතු ය.

04. අපනයනය සඳහා කෘතිම උපස්ථර මත කොරල් විශේෂ වගා කිරීම සඳහා වන බලපත්‍රයක් සඳහා වන යම් ඉල්ලීමක් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතු ය.

05. කිසිදු ජීවී කොටසක් හෝ කිසිදු කෘතිම උපස්ථර කොටසක් මුහුදට හෝ මුහුද වටා ඇති පරිසරයට මුදා නොහැරිය යුතු අතර සිදු කරනු ලබන සියලුම වගා කටයුතු ගොඩනැගිල්ලක් තුළ සිදුකළ යුතු ය.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

06. වගා කිරීමේ කටයුතු මධ්‍ය වඩදිය ඉම සිට කිලෝ මීටර් දහයක් (10 km) රට අභ්‍යන්තරයට වන සීමාවක් ඇතුළත පිහිටි පරිශ්‍රයක සිදු කළ යුතු අතර පහත පරිදි අපවිත්‍ර ජලය බැහැර කිරීම සිදුකළ යුතු ය.

(i) වෙරළට ආසන්නව පිහිටා ඇති පරිශ්‍රයක සිට බැහැර කෙරෙන අපවිත්‍ර ජලය කෙළින්ම මුහුදට බැහැර නොකළ යුතු අතර එම ජලය අවසාදිත ටැංකියකට එකතු කළ යුතු අතර අධිකාරිය විසින් නිර්දේශ කරන ලද සාන්ද්‍රණයකින් යුත් ක්ලෝරීන් භාවිත කිරීමෙන් අවසාදනය කළ යුතු අතර වෙරළේ වැලි තුළින් කාන්දුවීම මගින් බැහැර කළ යුතු ය.

(ii) වෙරළට පරිබාහිරව පිහිටා ඇති පරිශ්‍රයක සිට බැහැර කෙරෙන අපවිත්‍ර ජලය ක්ලෝරීන් භාවිත කිරීමෙන් අවසාදනය කළ යුතු අතර පසට කාන්දු නොවනසේ ගබඩා කළ යුතු ය.

07. අපවිත්‍ර ජලය සහ අවසාදිත ද්‍රව්‍යයන් අවසාදිත ටැංකියක් තුළින් බැහැර කළ යුතු ය.

08. කොරල් වගාව සඳහා භාවිත කරනු ලබන කෘතිම උපස්ථර මෙම නියෝගවල III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අධිකාරිය විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුව සකස් කරනු ලැබිය යුතු අතර ශ්‍රී ලංකා ජල තීරයෙන් ලබා ගන්නා ලද වෙනත් යම් උපස්ථරයක් හෝ ස්වභාවික උපස්ථරයක් භාවිත නොකළ යුතු ය.

09. උපස්ථරවල, අධිකාරිය විසින් නිකුත් කරනු ලබන අනුක්‍රමික අංකය සමග අධිකාරියේ සහ ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මුද්‍රාව මතුපිටට පෙනෙනසේ එම්බොස් කළ යුතු ය.

10. අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ මිස කිසිදු තැනැත්තකු විසින් කොරල් විශේෂ සහිත කෘතිම උපස්ථර ශ්‍රී ලංකාව තුළ ප්‍රවාහනය කිරීම හෝ වගා කිරීම නොකළ යුතු ය.

11. 4 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ජලජීවී වගා බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලීමක් ම මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතු අතර 4 වන නියෝගය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුව විය යුතු ය.

12. කොරල් වගාව සඳහා බලපත්‍රයක් ලබාගැනීමට අවශ්‍ය වන්නා වූ යම් ඉල්ලුම්කරුවකු විසින් එම බලපත්‍රය ලබා ගැනීමට පෙර අධිකාරිය විසින් යෝජනා කරනු ලබන සියළුම ආයතන වල නිර්දේශ ලබාගත යුතු අතර එම නිර්දේශයන් සහ 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත යටතේ සාදන ලද 2011.12.13 දිනැති අංක 1736/21 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2011 ජලජීවී වගා කළමනාකරණ නියෝග අනුව අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරන ලද තාක්ෂණික කමිටුවේ නිර්දේශයන් පිළිපැදිය යුතු ය.

13. ආනයනය කරනු ලබන සෑම කොරල් වගාවක්ම අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරන ලද ජංගම ක්ෂේත්‍ර පරීක්ෂක කමිටුවක් මගින් පරීක්ෂා කළ යුතු ය.

14. (469 වන අධිකාරය වූ) සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය නොවන පරිදි කොරල් විශේෂ ආනයනය කිරීම සහ වගාකිරීම සිදු කළ යුතු ය.

15. මෙම නියෝගවල

''කෘතිම උපස්ථර මත කොරල් විශේෂ වගාව'' යන්නෙන් සකස් කරන ලද උපස්ථර මත ආනයනය කරනු ලබන කොරල් විශේෂයෙන් හෝ ඉන් ලබාගන්නා දුහිතෘ පරම්පරාවන් සමුද්‍රීය පරිසරයෙන් බැහැරව පිහිටුවා ගනු ලබන මධ්‍යස්ථානයක් තුළ පිහිටි වගා මාධ්‍යයක වගා කිරීම අදහස් වේ.

''අධිකාරිය'' යන්නෙන් 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 2 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය අදහස් වේ.

## I වැනි උපලේඛනය

ශ්‍රී ලංකාව තුළ කෘතිම උපස්ථර මත කොරල් විශේෂ ප්‍රවාහනය කිරීම සඳහා වූ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම : ..........................................................................................................
02. ලිපිනය : ..........................................................................................................
03. ප්‍රවාහනය : ............................................................ සිට ............................................................ දක්වා
04. වාහන අංකය : ..........................................................................................................
05. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ අනුක්‍රමික අංකය } .....................................................................

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි/මා විසින් සපයනු ලබන තොරතුරු සාවද්‍ය හෝ වැරදි සහගත බවට සෙයා ගනු ලැබුවහොත් මගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි බවටත්, නිකුත් කොට ඇති බලපත්‍රයක් වේනම් එය අවලංගු කෙරෙනු ඇති බවත් මම දැන සිටිමි.

දිනය ..................................................... ..........................................
අත්සන

## II වැනි උපලේඛනය

*කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි*

ශ්‍රී ලංකාව තුළ කෘතිම උපස්ථර මත කොරල් විශේෂ ප්‍රවාහනය කිරීම සඳහා වන බලපත්‍රයේ ආකෘතිය

බලපත්‍ර අංකය : ..........................................
දිනය : ..........................................................

01. ලැබී ඇති යොමු සැලසුම්, වාර්තා සහ අනෙකුත් ලේඛන : ..........................................................................
02. ඉල්ලා ඇති යම් අතිරේක තොරතුරු පිළිබඳ විස්තර : ..........................................................................
03. බලපත්‍රය ලබා දී ඇත්නම් : ..........................................................................
    (i) බලපත්‍ර අංකය : ......................................
    (ii) බලපත්‍රයේ දිනය : ....................................
    (iii) වලංගු කාලය : ....................................... සිට ........................................................ දක්වා
04. බලපත්‍රයේ අමුණා ඇති කොන්දේසි (තිබේ නම්)
    (i) ..........................................................................................................
    (ii) ..........................................................................................................
    (iii) ..........................................................................................................
05. බලපත්‍රය ප්‍රතික්ෂේප කර ඇත්නම් බලපත්‍රය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු :
    ..........................................................................................................
    ..........................................................................................................
    ..........................................................................................................

දිනය : .............................................. ...............................................
බලපත්‍ර ලබාදීමේ නිලධරයාගේ
අත්සන හා තනතුර

## III වැනි උපලේඛනය

*ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්*

(1) ජලජ සත්වයන් සඳහා උපස්ථර සකස් කිරීමේදී පිඟන් මැටි, උළු මැටි හෝ කොහු භාවිත කළ යුතුය.

(2) ජලජීවී වගාව සිදු කරනු ලබන කෘතිම උපස්ථරවල ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන අනුක්‍රමික අංකය සමග ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහ ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මුද්‍රාව මතුපිටට පෙනෙනසේ එම්බොස් කළ යුතු ය.

(3) අනුක්‍රමික අංකය අංක හයකින් සමන්විත විය යුතු අතර ජලජීවී වගාව සිදු කරනු ලබන කෘතිම උපස්ථර මත සියළුම අංක දැක්විය යුතු ය.

(4) භාවිත කරනු ලබන ජලජීවී වගාව සිදු කරනු ලබන කෘතිම උපස්ථරවල සාම්පල ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කළ යුතු අතර එහි අනුමතය ලබා ගත යුතු ය.

(5) සමාන අනුක්‍රමික අංක සහිත උපස්ථර වගා නොකළ යුතු අතර අනුක්‍රමික අංක සහිත උපස්ථර ආරෝහණ පිළිවෙලට තැම්පත් කළ යුතු ය. යම්කිසි ක්ෂේත්‍රයකට නිකුත් කරන ලද අනුක්‍රමික අංකයක් වෙනත් ක්ෂේත්‍රයකට භාවිත නොකළ යුතු ය.

08 - 977/1

---

එල්.ඩී.බී. 1/2012 (II)

### 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත

1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 37 වන වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද අමරවීර (පා.ම.),
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2017 ජුලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

01. මෙම නියෝග 2017 අංක 02 දරන කිවුල් දිය ඉස්සන් (Penaeus species) අභිජනනය කිරීම සඳහා මව් ඉස්සන් එකතු කිරීමේ, රඳවා තබා ගැනීමේ සහ සැපයීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. යම් මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් ධීවර සහ ජලජ සම්පත් පනතේ 39 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කිසිදු තැනැත්තකු විසින් මව් ඉස්සන් එකතු කිරීම, රඳවා තබා ගැනීම සහ සැපයීම සිදු කරනු ලබන මධ්‍යස්ථානයක් නඩත්තු නොකළ යුතු ය.

03. මව් ඉස්සන් එකතු කිරීමේ, රඳවා තබා ගැනීමේ හා සැපයීමේ සියලුම මධ්‍යස්ථාන, අඩු කාල සීමාවකදී මුහුදේ සිට මව් ඉස්සන් ප්‍රවාහනය කළ හැකිවන පරිදි වෙරළට ආසන්නව පිහිටුවිය යුතු ය.

04. මව් ඉස්සන් එකතු කිරීමේ, රඳවා තබා ගැනීමේ හා සැපයීමේ සියලුම මධ්‍යස්ථාන 1 වන ඇමිණුමෙහි නිශ්චිතව දක්වා ඇති මව් ඉස්සන් ප්‍රවාහනය කිරීමේ ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාත්මක කළ යුතු ය.

05. ජලජීවී වගා කළමනාකරණ බලපත්‍රයේ අධිකාරිය විසින් නිශ්චිතව දක්වා ඇති මුහුදු ප්‍රදේශයන්ගෙන් මව් ඉස්සන් එකතු කළ යුතු ය.

06. අභිජනනය සඳහා තෝරාගත් ගැහැණු මව් ඉස්සකුගේ සහ පිරිමි මව් ඉස්සකුගේ ශීර්ෂෞරසයේ අවම දිග පිළිවෙලින් මිමී 55 සහ මිමී 45 ට අඩු නොවිය යුතු ය.

07. මුහුදේ සිට මව් ඉස්සන් ලබා ගන්නා අවස්ථාවේදී සහ මව් ඉස්සන් තෝරා ගැනීමේදී, එක් එක් මව් ඉස්සකු සඳහා වෙන් වෙන්ව අත් ආවරණ, දැල් අතංගු සහ අනෙකුත් උපකරණ භාවිත කළ යුතු ය.

08. කිසිදු තැනැත්තකු විසින් මව් ඉස්සන් රඳවා තබා ගන්නා ස්ථානයේ එම මව් ඉස්සන් රඳවා තබා ගන්නා අවස්ථාවේදී කෙලින්ම හිරුඑළියට නිරාවරණය වන ලෙස තබා නොගත යුතු ය.

09. මව් ඉස්සන් එකතු කිරීම සඳහා බලයලත් සෑම මධ්‍යස්ථානයකම අභිජනනාගාරය වෙත සැපයීම සිදු කරන තෙක් එම මව් ඉස්සන් තොග ගබඩා කර තැබීම සඳහා ප්‍රමාණවත් වෙන් වෙන් භාජන සහ එම භාජන සඳහා වෙන් වෙන්ව සකස් කරන ලද ජල සැපයුම් හා වායු සැපයුම් තිබිය යුතු ය.

10. එකතු කිරීමේ මධ්‍යස්ථානයේ තිබෙන මව් ඉස්සන් තොගයේ ස්පර්ශක, අක්ෂි වෘන්ත, තුන්ඩිකාව, ප්ලව පාද සහ සංචරණ පාද අවපැහැ හෝ රතුපැහැ වී නොතිබිය යුතු ය.

11. මව් ඉස්සන් එකතු කිරීමේ මධ්‍යස්ථානය භාරව සිටින යම් තැනැත්තකු එම මධ්‍යස්ථානය තුළ යම් මියගිය මව් ඉස්සන් හෝ සුදුපුල්ලි රෝගය ආසාදිත මව් ඉස්සන් රඳවා තබා නොගත යුතු ය.

12. මව් ඉස්සන් එකතු කිරීම සඳහා භාවිත කරනු ලබන ටැංකි, භාජන, අතංගු, සහ අනෙකුත් උපකරණ ක්ලෝරීන් භාවිතා කර ජීවානුහරනය කිරීම කළ යුතු අතර සවස් කාලයේ වියළීම කළ යුතු ය.

13. කිසිදු තැනැත්තකු විසින් එකතු කිරීමේ මධ්‍යස්ථානය තුළ මව් ඉස්සන් පැය විසිහතරකට (24) වඩා තබා නොගත යුතු අතර පිරිසිදු කරන ලද දැල්ලන් ආහාර වශයෙන් ලබාදිය යුතු ය. කිසිදු තැනැත්තකු විසින් කිසිදු අවස්ථාවකදී ක්‍රස්ටේෂියා ආහාර ලෙස භාවිතා නොකළ යුතු ය.

14. කිසිදු තැනැත්තකු විසින් මව් ඉස්සන් ඉවත් කරනු ලබන අවස්ථාවේදී කිසිදු මව් ඉස්සකු මුහුදට නොදැමිය යුතු අතර අතිරික්ත ඉස්සන් විනාශ කළ යුතු ය. කිසිදු අතිරික්ත මව් ඉස්සන් මව් ඉස්සන් එකතු කිරීමේ මධ්‍යස්ථානය තුළ ගබඩා නොකළ යුතු ය.

15. මව් ඉස්සන් එකතු කරනු ලබන ප්‍රදේශය, මව් ඉස්සන් එකතු කිරීමේ දිනය, එකතු කරන්නාගේ නම සහ ලිපිනය, එකතු කරන ලද මව් ඉස්සන් සංඛ්‍යාව, අභිජනනාගාරයට ප්‍රවාහනය කරනු ලබන දිනය, සහ මව් ඉස්සන් නිකුත් කරනු ලබන අභිජනනාගාරය වැනි කරුණු පිළිබඳ වාර්තා තබා ගත යුතු ය.

16. මව් ඉස්සන් ප්‍රවාහනය භාරව සිටින කිසිදු තැනැත්තකු විසින් ප්‍රවාහනය සඳහා මව් ඉස්සන් සකස් කරනු ලබන අවස්ථාවේදී එම ඉස්සන්ට හානි සිදු කිරීම හෝ පීඩාවට පත් කිරීම නොකළ යුතු ය. යම් තැනැත්තකු විසින් ප්‍රවාහනය කිරීමට පැය විසිහතරකට පෙර යම් මව් ඉස්සකුට ආහාර ලබාදීම නතර කළ යුතු ය.

17. මව් ඉස්සන් එකතු කිරීමේ මධ්‍යස්ථානය භාරව සිටින යම් තැනැත්තකු විසින් එම ඉස්සන් වෙන් වෙන්ව අසුරණයක ඇසිරිය යුතු ය. එම අසුරන මෙහි I වන ඇමිණුමේ නිශ්චිතව දක්වා ඇති අධිකාරිය විසින් නිර්දේශ කරන ලද ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය.

18. ඇසුරුම් තුළ ජලයේ ප්‍රශස්ත තත්වයන් එනම් උෂ්ණත්වය (20-25$^0$C), ඇමෝනියා සාන්ද්‍රණය (< 0.1 ppm) ඔක්සිජන් සාන්ද්‍රණය ( >4 ppt) තිබිය යුතු ය.

19. මව් ඉස්සන් අභිජනනාගාරයේ හිමිකරු වෙත ලබා දීමේ දී, මව් ඉස්සන් අල්ලනු ලැබූ ප්‍රදේශය පිළිබඳ විස්තර, සැපයුම්කරුගේ විස්තර සහ දිනය මෙහි 2 වන ඇමුණුමේ නිශ්චිතව දක්වා ඇති අධිකාරිය විසින් නිකුත් කරන ලද ආකෘතියට අනුව අභිජනනාගාරයේ හිමිකරු වෙත ඉදිරිපත් කළ යුතු ය.

20. මව් ඉස්සන් එකතු කිරීමේ මධ්‍යස්ථානයක යම් හිමිකරුවකු විසින් අධිකාරිය විසින් හඳුන්වා දෙනු ලැබූ කළමනාකරණ පරිචය අනුගමනය කළ යුතු ය.

21. මෙම නියෝග යටතේ නියම කර ඇති සහ පනවා ඇති සියලු නියමයන්ට අනුකූලව එම ව්‍යවසාය විසින් ක්‍රියාකර ඇත්ද යන්න තහවුරු කර ගැනීම පිණිස සහ සාම්පල ලබා ගැනීමට සහ ලේඛණ හා වාර්තා ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබූ පරීක්ෂකවරයෙකුට හෝ වෙනත් නිලධරයකුට මව් ඉස්සන් එකතු කිරීමේ යම් මධ්‍යස්ථානයක් තුළට ඇතුල්වීමට බලය තිබිය යුතු ය.

22. මේ නියෝගවල

''අධිකාරිය'' යන්නෙන් 1998 අංක 53 දරන ''ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය අදහස් වේ.

''මව් ඉස්සන් එකතු කිරීම සඳහා වන මධ්‍යස්ථාන'' යන්නෙන් සජීවී මනා සෞඛ්‍ය තත්වයෙන් යුත් ඉස්සන් අභිජනනය කිරීම සඳහා මව් ඉස්සන් මුහුදෙන් ලබාගෙන අභිජනන මධ්‍යස්ථාන වෙත ලබාදෙන තෙක් මව් ඉස්සන් රැස්කර තබන මධ්‍යස්ථානය අදහස් වේ.

*ඇමුණුම් 01* : මව් ඉස්සන් ප්‍රවාහනය සඳහා වන ප්‍රමිතීන්

එක් මව් ඉස්සකු ප්‍රවාහනය කිරීම සඳහා සෙන්ටි මීටර් 30 ක උසින් යුතු සහ සෙන්ටි මීටර් 10 ක් පළලැති පොලිතීන් අසුරනයක් භාවිතා කළ යුතු ය. මව් ඉස්සන් ප්‍රවාහනය කිරීමේ දී බැගය තුළ 4 ppm ඔක්සිජන් සාන්ද්‍රණයකින් යුත් ජලය එහි තිබිය යුතු ය. ඉස්සාගේ තුන්ඩිකාව (Rostrum) සහ අන්ත්‍යය (Telson) ටියුබයේ කපාටයේ කොටසක් මගින් ආවරණය කර තිබිය යුතු ය.

*ඇමුණුම් 02* : මව් ඉස්සන් අභිජනනාගාර වෙත නිකුත් කිරීමේ බිල්පතෙහි ආකෘතිය

මව් ඉස්සන් අභිජනනාගාර වෙත නිකුත් කිරීමේ බිල්පත

01. මව් ඉස්සන් මිලදී ගත් ස්ථානය :

| |
|---|
| |

(එක් ස්ථානයක් සඳහා එක් බිල්පත්‍රයක් නිකුත් කළ යුතු ය)

02. සැපයුම්කරුගේ නම :

ලිපිනය :

බලපත්‍ර අංකය :

03. නිකුත් කළ මව් ඉස්සන්ගේ විස්තර

අනුක්‍රමික අංකය .......................................................... මිලදීගත් දිනය සහ වේලාව ..........................................................

| කැබලි ප්‍රමාණය | පිරිමි | ගැහැණු | බිත්තර සහිත ගැහැණු |
|---|---|---|---|
| | | | |

04. නිකුත් කරන ලද අභිජනනාගාරයේ නම :

.....................................................................

05. නිකුත් කළ දිනය

.....................................................................

නිකුත් කළේ ලැබුවේ

නම ................................................................. නම .................................................................

අත්සන ................................................................. අත්සන .................................................................

08 - 977/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.